# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## තනතුරු ඇබෑර්තු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුර : කළමනාකරු (වරාය නිරාපද) (මධ්‍යම කළමනාකරණ පළමුවන මට්ටම)** - MLM 1

**(අ) යෝග්‍යතාවය**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද රසායන විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධියක් හා ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ආයතනයේ (NIOSH) වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ඊට සමාන සුදුසුකමක්.

**සමග**

**පළපුරුද්ද :**

අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම

**(ආ) වැටුප**

| | |
|---|---|
| වැටුප් කාණ්ඩය | : 4 : 1 (MLM 1) |
| ආරම්භක වැටුප | : රු. 92,650/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : රු. 1,725/= |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 185,000/= ක් පමණ වේ.

**02. තනතුර : නාවික හා භාරන යාත්‍රාපති (මධ්‍යම කළමනාකරණ දෙවන මට්ටම)** - MLM 2

**(අ) යෝග්‍යතාවය**

දළ බර ටොන් 3000 ට නොවැඩි වෙරළාසන්න මුහුදු ගමන්වල යෙදෙන නෞකාවල යාත්‍රාපතිවරයෙකු ලෙස සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන සහතිකයක්

**හෝ**

ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජෙනරාල් විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ වෙනත් උසස් මට්ටමේ වලංගු ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත් කරනු ලැබූ වෙනත් උසස් මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සමග**

**පළපුරුද්ද:**

වසර දෙක (02) ක අදාළ මුහුදු ගමන් පළපුරුද්දක් ලබා තිබීම

**(ආ) වැටුප**

| | |
|---|---|
| වැටුප් කාණ්ඩය | : 4 : 2 (MLM 2) |
| ආරම්භක වැටුප | : රු. 82,505/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : රු. 1,585/= |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 175,000/= ක් පමණ වේ.

**03. තනතුර : කොට්ඨාසීය ගිනි නිවීමේ නිලධාරී (කනිෂ්ඨ කළමනාකරණ මට්ටම)** - JLM

(අ) යෝග්‍යතාවය

එක්සත් රාජධානියේ ගිනි ඉංජිනේරු ආයතනයේ උපාධියක්

**සමග**

**පළපුරුද්ද**

අදුළු ක්ෂේත්‍රයේ සමාන තනතුරක වසර පහ (05) ක පළපුරුද්ද.

**(ආ) වැටුප**

| | |
|---|---|
| වැටුප් කාණ්ඩය | : 5 : 0 (JLM) |
| මූලික වැටුප | : රු. 75,065/- |
| වැටුප් වර්ධකය | : රු. 1,440/= |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප ආසන්න වශයෙන් රු. 170,000/= පමණ වේ.

**සටහන :**

1. ගිනි නිවන හමුදාවේ කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් සකස් කිරීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීමේ හැකියාව
2. බර වාහන රියදුරු බලපත්‍රයක් ලබාතිබීම.
3. යහපත් කායික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා ශ්‍රවණ හා දෘෂ්‍ය හැකියාවකින් යුක්ත විය යුතුය. (වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.)

**සටහන :**

ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 45 ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි.)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියලුම නීතිරීතිවලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළයුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි අධිකාරියේ ඕනෑම අංශයක/ කොට්ඨාසයක හෝ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග **ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන), මානව සම්පත් හා පරිපාලන කොට්ඨාශය - විධායක අංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13.** යන ලිපිනයට ලැබෙන සේ 2026-06-08 වන දින හෝ ඊට පෙර **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතුයි. **අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

**අදාල සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති.**